
# කුරුළු නුවණ



B.A. SENUMI GIHANSA BANDARA

# කුරුළු නුවණ

B.A.SENUMI GIHANSA BANDARA

# කුරුළු නුවණ

බී.ඒ.සෙනුමි ගිහන්සා බණ්ඩාර
2 ශ්‍රේණිය D
මහාමායා බාලිකා විදුහල
මහනුවර

මුද්‍රණය

2025.02.08

කතෘ ගේ වෙනත් කෘති

- මිතුරුකම
- උඩඟු මාලුවා

ISBN– 978 – 624 – 208 - 176 - 2

# <u>පිදුම</u>

මිණිකැට මෙන් මුතු අකුරු එකිනෙක

පද බැද

සිප් සතර මුල පුරන්නට දිරිය දුන්

මාගේ ගයත්‍රී ගුරු මෑණියන්ටද

නිතැතින් මාගේ සෙවනැල්ල මෙන්

හිඳිමින් සියලු කාර්යන්ට ශක්තියක්

වන

මාගේ මවට , පියාට

පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙනේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතිය ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

එකෝමත් එක රටක ලස්සන පුංචි කැලයක් තිබ්බා.



මේ කැලේ ලොකු ගහක්, ලස්සන කුරුල්ලෝ තුන් දෙනෙක් ජීවත් වුණා.




මෙයාලාගෙන් ලොකුම කුරුලු සහෝදරයා හරිම කම්මැලියෙක්. නිතරම නිදාගන්න තමයි එයා කැමති.



දෙවැනි කුරුලු සහෝදරයා තමන්ට තියෙන විදියට ජීවත් වෙන්න ඕන කියලා හිතුවා.

නමුත් තුන්වෙනි කුරුලු සහෝදරයා හැමදේම ගැන හොඳින් හිතනවා. අනාගතය ගැන හිතලා වැඩ කරනවා.



දවසක් කැලේට ආව දඩයක්කරුවන් පිරිසක් මේ කුරුල්ලෝ දැක්කා. එයාලව අල්ලාගෙන ගොස් විකුණාන්න හිතුණා.

ඒ කතාව ඇසුණු තුන්වෙනි කුරුල්ලා වහාම ගොස් අනිත් අයට ඒ ගැන කිව්වා. ඒත් එයාලා මොකුත් කළේ නැ. තමන්ට ඇසුනේ නෑ වගේ හිටියා. සුපුරුදු ලෙස ලොකු කුරුලු සහෝදරයා නිදාගත්තා. දෙවැනි සහෝදරයා කූඩුවේ තිබූ පළතුරු කෑල්ලක් කෑවා. නුවණ ඇති කුරුල්ලාට නම් අනාගතය ගැන ලොකු බියක් දැනුණා.

දවසක් උදෙන්ම දඩයක්කරුවන් පැමිණ දැලක් දමා කුරුල්ලන්ව අල්ලා ගත්තා.



පළමු සහ දෙවැනි කුරුල්ලෝ හඬමින් කෑගැසුවත් තුන්වන කුරුල්ලා මැරුණා වගේ හිටියා.



දඩයක්කරුවන් කුරුල්ලන් රැගෙන ගොස් දැලෙන් ඉවතට ගන්නා විට එක් කුරුල්ලෙක් මැරිලා කියා ඈතට විසි කළා.



ඒ තුන්වන නුවණක්කාර කුරුල්ලා වේගයෙන් ඉගිල ගියා. අනෙක් සහෝදර කුරුල්ලන් දෙදෙනා කූඩුවක සිර වුණා.



තැනට සුදුසු නුවණ නිසා විපතෙන් බේරුණු කුරුල්ලා තම අනුවණ සහෝදරයන් දෙදෙනා ගැන බොහෝ දුක් වුණා.

නුවණක්කාර කුරුල්ලා තමාගේ ජීවිතය බේරා ගත්තත් සහෝදරයන් බේරාගැනීමට නොහැකි වීම ගැන ඉතාමත් කණගාටු වුණා.

සෑම විටම අප අවට පරිසරය ගැන හොඳ කල්පනාවෙන් සිටීමත් අනාගතය ගැන සිතා වැඩ කිරීමත් නිසා අපගේ ජීවිත ලස්සන කරගන්න පුලුවන්.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනය ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ ධරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ ඔක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්